# 4 ශ්‍රේණිය සිංහල

# පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු

## 10 ඒකකය - 2022



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 10 සවනිගේ දිනපොතෙන්

## මාර්තු 02 සෙනසුරාදා

කතන්දර පොතක් කියවන්න ගත්තා. පිටුවෙන් පිටුව කියවන්න ආසයි. ඊළඟට මොකක් වෙයි ද කියලා හිතාගන්නත් බැහැ. පොත එක හුස්මට කියෙවුවා. කතාව හරි ලස්සනයි. ඒ පොතේ නම 'කූඹි හොරා'. මා කියවූ පොත් ලැයිස්තුවට මේ කතන්දර පොතේ නමත් ලියා ගත්තා.



## මාර්තු 03 ඉරිදා

ගෙදර වැඩට රචනාවක් ලියන්න දුන්නා. 'කුරුලු ලෝකය' ගැන. හොඳ ම රචනාව බිත්ති පුවත්පතට තෝරා ගන්නවා කිවුවා. මම පිරිසිදුවට පැහැදිලි අකුරින් රචනාව ලිවුවා. අකුරක් නැර ආයෙත් කියෙවුවා. වැරැද්දක් තිබුණේ නැහැ. හෙට ඉස්කෝලෙට ගෙනියනවා.





## මාර්තු 04 සඳුදා

බිත්ති පුවත්පතට තෝරුණේ මගේ රචනාව නමයි. මගේ ඉහේ මලක් පිපුණා වගේ. ගෙදර ගියේ ඒ ගැන අම්මාට කියන්න. මාමාත් අපේ ගෙදර ඇවිත් හිටියා. දෙන්නාට ම මම රචනාව ගැන කිවුවා. ඒ අයත් සතුටු වුණා.

## මාර්තු 05 අඟහරුවාදා



ඉස්කෝලෙ ඇරිලා ගෙදර එද්දි ළමයෙකුට කෙසෙල් ලෙල්ලක් පෑගුණා. ළමයා ලිස්සලා වැටෙන්න ගිහින් අනූනවයෙන් බේරුණේ.

පාරේ කෙසෙල් ලෙලි දාන්න හොඳ නැති බව ගුරුතුමිය දවසක් කිවුවා. මට ඒ වෙලාවේ ඒක මතක් වුණා. මම ඉක්මනට දුවලා ගිහින් ඒ කෙසෙල් ලෙල්ල ළඟ තිබුණු කසළ බඳුනට දැම්මා.

ගෙදර ඇවිත් මම ඒ සිද්ධිය චිත්‍රයට නැගුවා. මාමාට පෙන්නුවා. පාට කරලා පත්තරේට යවමු කියලා මාමා කිවුවා. මට හරි සතුටුයි. මම චිත්‍රය පාට කළා.

## මාර්තු 06 බදාදා

ගස්වැල් අඹරමින් සුළඟ හැමුවා. අවට අඳුරු වුණා. එකපාරට ම හයියෙන් වහින්න ගත්තා. විදුලි එළි අහසෙ විහිදුණා. මහ හඬින් ගෙරෙවුවා. එළියට බහින්නවත් බැහැ. මාමා ගමේ යන්න පාන්දරම සූදානම් වුණා. "මේ මොර සූරන වැස්සෙ කොහේ යන්න ද" කියලා තාත්තා මාමාගෙන් ඇහුවා.

වැස්ස පැමුවා ම මාමා ගමේ ගියා. මාත් ඉස්කෝලෙ ගියා.



# 04 ශ්‍රේණිය සිංහල 10 ඒකකය - සවනිගේ දිනපොතෙන්

Online Class Details (2022) Hasitha Hettiarachchi WhatsApp 071-9020298



1. මාර්තු 02 සෙනසුරාදා - ..........................................................................
2. මාර්තු 03 ඉරිදා - ..........................................................................
3. මාර්තු 04 සඳුදා - ..........................................................................
4. මාර්තු 05 අඟහරුවාදා - ..........................................................................
5. මාර්තු 06 බදාදා - ..........................................................................

- **අවබෝධය**

❖ පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර දෙන්න.

1. හිස්තැනට වඩාත් සුදුසු යෙදුම වරහන් තුළින් තෝරා ලියන්න. (එක හුස්මට, අකුරක් නෑර, ඉහේ මලක් පිපුණා, අනූ නවයෙන් බේරුණි, මොර සූරන වැස්සේ)

   i. අයියා ළිඳ ළඟ වැටෙන්නට ගොස් ..........................................................

   ii. ගුරුතුමිය ළමයින්ගේ රචනා ......................................... කියවූවා ය.

   iii. බලු පැටියා කෝප්පයේ තිබූ කිරි ටික ............................. බිවුවේ ය.

   iv. තාත්තා නංගිට බෝනික්කෙක් ගෙනාවේ ය. නංගිගේ .......................................... වගේ පෙනුණි.

   v. ................................ පැමිණි මාමා ගෙට ගොඩ වූයේ හොඳට ම තෙමී ගෙන ය.

- **ක්‍රියාකාරකම 1**



1. පහත ඉඟි වැකි යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

   i. අකුරක් නෑර
   ii. ඉහේ මලක් පිපුණා
   iii. අනූනවයෙන් බේරුණා
   iv. මොර සූරන වැස්ස

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

- **ක්‍රියාකාරකම 3**

1. පුංචි ඔබත් ඔබේ එදිනෙදා ජීවිතයේ විශේෂ සිදුවීම් දිනපොතක ලිවීම අද සිට ම ආරම්භ කරන්න. උදා:-

   ..................................................................................................
   ..................................................................................................
   ..................................................................................................
   ..................................................................................................
   ..................................................................................................
   ..................................................................................................
   ..................................................................................................

## රූඪි/ඉඟි වැකි

- වචනයේ මතුපිට අර්ථයට වඩා ඉක්මවා යන අර්ථයක් ඇති යෙදුම් ........................... ලෙස හඳුන්වයි. ඉඟි වැකියක් මඟින් ප්‍රකාශ කිරීමට යන අදහස වඩා පැහැදිලි වත්, රසවත් ලෙසත් ඉදිරිපත් කළ හැකි වෙයි.

- කියවීම් පොතේ ඇතුළත් සවනිගේ දින පොතෙන් පාඩම ආදර්ශ කියවීමක යෙදෙන්න. පහත සඳහන් ඉඟි වැකි වලට සුදුසු අර්ථය තෝරා යා කරන්න.

| | |
|---|---|
| 1. එක හුස්මට | යම් විපතකින් යාන්තමින් ගැළවීම යි. |
| 2. අකුරක් නෑර | දැඩි සතුටකට පත් වීම යි. |
| 3. ඉහේ මලක් පිපුණා | අධික වර්ෂාව යි. |
| 4. අනූ නවයෙන් බේරුණා | කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීමයි. |
| 5. මොර සූරන වැස්ස | යම් කිසි කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරීම යි. |

- හිස්තැනට ගැළපෙන වාක්‍යය වරහන තුළින් තෝරා ලියන්න. (ඉතාමත් තද වර්ෂාවක් පවතින විට කියයි./ ඉතා ඉක්මනින් යමක් කියවා අවසන් වූ විට කියයි./ දැඩි සතුටක දී කියයි./ සම්පූර්ණයෙන් ම කියවා අවසන් වූ විට කියයි./ නොසිතූ විටක බේරුණු විට දී කියයි.)

1.එක හුස්මට

..................................................................................................

2.අකුරක් නෑර

..................................................................................................

3.ඉහේ මලක් පිපුණා

..................................................................................................

4.අනූ නවයෙන් බේරුණා

..................................................................................................

5.මොර සූරන වැස්ස

..................................................................................................

# පිළිතුරු



**Answer**

# 04 ශ්‍රේණිය සිංහල 10 ඒකකය - සවනිගේ දිනපොතෙන්



Online Class Details (2022) Hasitha Hettiarachchi WhatsApp 071-9020298

1. මාර්තු 02 සෙනසුරාදා - එක හුස්මට......................................................
2. මාර්තු 03 ඉරිදා - අකුරක් නෑර......................................................
3. මාර්තු 04 සඳුදා - ඉහේ මලක් පිපුණා..............................................
4. මාර්තු 05 අඟහරුවාදා - අනුනවයෙන් බේරුණා.....................................
5. මාර්තු 06 බදාදා - මොර සූරන වැස්ස..............................................

- **අවබෝධය**

❖ පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර දෙන්න.

1. හිස්තැනට වඩාත් සුදුසු යෙදුම වරහන් තුළින් තෝරා ලියන්න. (එක හුස්මට, අකුරක් නෑර, ඉහේ මලක් පිපුණා, අනු නවයෙන් බේරුණි, මොර සූරන වැස්සේ)

   i. අයියා ළිඳ ළඟ වැටෙන්නට ගොස් ..අනු නවයෙන් බේරුණි.......................
   ii. ගුරුතුමිය ළමයින්ගේ රචනා ..........අකුරක් නෑර.......... කියවූවා ය.
   iii. බලු පැටියා කෝප්පයේ තිබූ කිරි ටික ....එක හුස්මට.... බිවුවේ ය.
   iv. තාත්තා නංගිට බෝනික්කෙක් ගෙනාවේ ය. නංගිගේ ......ඉහේ මලක් පිපුණා... වගේ පෙනුණි.
   v. .මොර සූරන වැස්ස. පැමිණි මාමා ගෙට ගොඩ වූයේ හොඳට ම තෙමී ගෙන ය.

- **ක්‍රියාකාරකම 1**

1. පහත ඉඟි වැකි යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

   i. අකුරක් නෑර
   ii. ඉහේ මලක් පිපුණා
   iii. අනුනවයෙන් බේරුණා
   iv. මොර සූරන වැස්ස



මම පෙළ පොතේ පාඩම් සියල්ල අකුරක් නෑර කියෙව්වෙමි.

මගේ උපන් දිනයට තෑගි ගොඩක් ලැබීමෙන් මගේ ඉහේ මලක් පිපුණි.

නිමල් පාලම ළඟ ලිස්සා වැටීමට ගොස් අනු නවයෙන් බේරුණි.

මම මොර සූරන වැස්සේ ම පාසල් යාමට පිටත් වුණෙමි.

- ක්‍රියාකාරකම 3

1. පුංචි ඔබත් ඔබේ එදිනෙදා ජීවිතයේ විශේෂ සිදුවීම් දිනපොතක ලිවීම අද සිට ම ආරම්භ කරන්න. උදා:-




## රූඩී/ඉගි වැකි

- වචනයේ මතුපිට අර්ථයට වඩා ඉක්මවා යන අර්ථයක් ඇති යෙදුම් ..රූඩී/ඉගි වැකි.. ලෙස හඳුන්වයි. ඉගි වැකියක් මගින් ප්‍රකාශ කිරීමට යන අදහස වඩා පැහැදිලි වත්, රසවත් ලෙසත් ඉදිරිපත් කළ හැකි වෙයි.

- කියවීම් පොතේ ඇතුළත් සවනිගේ දින පොතෙන් පාඩම ආදර්ශ කියවීමක යෙදෙන්න. පහත සඳහන් ඉගි වැකි වලට සුදුසු අර්ථය තෝරා යා කරන්න.

1. එක හුස්මට
2. අකුරක් නෑර
3. ඉහේ මලක් පිපුණා
4. අනූ නවයෙන් බේරුණා
5. මොර සූරන වැස්ස

- යම් විපතකින් යාන්තමින් ගැළවීම යි.
- දැඩි සතුටකට පත් වීම යි.
- අධික වර්ෂාව යි.
- කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීමයි.
- යම් කිසි කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරීම යි.

- හිස්තැනට ගැළපෙන වාක්‍යය වරහන තුළින් තෝරා ලියන්න. (ඉතාමත් තද වර්ෂාවක් පවතින විට කියයි./ ඉතා ඉක්මනින් යමක් කියවා අවසන් වූ විට කියයි./ දැඩි සතුටක දී කියයි./ සම්පූර්ණයෙන් ම කියවා අවසන් වූ විට කියයි./ නොසිතූ විටක බේරුණු විට දී කියයි.)

1.එක හුස්මට

..ඉතා ඉක්මනින් යමක් කියවා අවසන් වූ විට කියයි.................

2.අකුරක් නෑර

..සම්පූර්ණයෙන් ම කියවා අවසන් වූ විට කියයි.................

3.ඉහේ මලක් පිපුණා

..දැඩි සතුටක දී කියයි.................

4.අනූ නවයෙන් බේරුණා

..නොසිතූ විටක බේරුණු විට දී කියයි.................

5.මොර සූරන වැස්ස

..ඉතාමත් තද වර්ෂාවක් පවතින විට කියයි.................

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ